# 09 පුස්තකාලයට යමු




ආයුබෝවන් ! සුබ උදෑසනක්

ආයුබෝවන් !

පුස්තකාලය උදෙන් ම අරිනවා ද?

ඔව්, උදේ අටට **අරිනවා.**

**කෝ** ඔයාලාගේ බෑග්? ඒවා මෙතන තියලා යන්න.

මෙන්න ටෝකන් එක. මේක අරගෙන යන්න.

බොහොම ස්තුතියි.

මගේ අලුත් සාමාජික කාඩ් පත ගන්න ඕනෑ.

ගිය සතියේ මම **ඉල්ලුම් පත්‍රයක්** දුන්නා.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

නම කියන්න.

මාධවී සුමන්තිරන්.

ආ... කාඩ් දෙකක් තියෙනවා.

බොහොම ස්තුතියි.

මෙතන අත්සන් කරන්න.

පොත් ගන්නේ කොහොම ද?

කාඩ් දෙකට පොත් දෙකක් ගන්න පුළුවන්.

පොත් දවස් කීයක් තියා ගන්න පුළුවන් ද?



සති දෙකයි. සති දෙකෙන් ගේන්න බැරි වුණොත්

ගාස්තුවක් අය කරනවා.

ඒ කොහොම ද?

ප්‍රමාද ගාස්තු දින ගණනට ගෙවන්න ඕනෑ.

දවසට රුපියල යි.

ඊට පස්සේ පොත් ගන්න පුළුවන් ද?

පුළුවන්. පොත් ගන්න කොට හොඳට පෙරළලා බලලා ගන්න.

පිටු කඩන්න එපා. කුරුටු ගාන්න එපා.

පොත්වල පිටු කැඩිලා තිබුණොත් කියන්න.

පොත් පරිස්සම් කරන්න.

හොඳයි, උදව්වක් කරන්න පුළුවන් ද?

ඔව්, කියන්න.

කතන්දර පොත් තියෙන්නේ කොතැන ද?

අර වම් පැත්තේ අල්මාරි තුනේ ම ඇති. ඇරලා බලන්න.

එවායේ දෙවැනි තට්ටුවේ

ඔයාලාට ගැළපෙන ඒවා තියෙනවා.

බොහොම ස්තුතියි.

හොඳයි, ගිහින් පොත් අරං එන්න.

## වචන මාලාව

| | |
|---|---|
| අරිනවා | - திறக்கப்படுகிறது |
| කෝ | - எங்கே? |
| ඉල්ලුම් පත්‍රයක් | - விண்ணப்பப்படிவம் |
| පොත් | - புத்தகம் |
| සති දෙකයි | - இரண்டு வாரம் |
| අය කරනවා | - அறவிடப்படும் |
| ප්‍රමාද ගාස්තු | - தாமதக் கட்டணம் |
| ඊට පස්සේ | - அதற்கு பிறகு |
| කුරුටු ගාන්න එපා | - கீர வேண்டடம். |
| පරිස්සම් කරන්න | - பாதுகாத்துக் கொள்ளுங்கள் |
| උදව්වක් | - உதவி |
| වම් පැත්තේ | - இடது பக்கமாக |
| ඇති | - போதும் |
| ඇරලා | - திறந்து |
| බලන්න | - பாருங்கள் |
| අරං එන්න | - கொண்டு வாருங்கள் |

## ක්‍රියාකාරකම 01

යා කරමු. කියවමු. இணைப்போம். வாசிப்போம்.

| | |
|---|---|
| පොත් දෙකක් | කරන්න |
| ප්‍රමාද ගාස්තු | බලන්න |
| පොත් පරිස්සම් | අය කරනවා |
| වම් පැත්තේ | අරින්න |
| අල්මාරිය | ගන්න පුළුවන් |

## ක්‍රියාකාරකම 02

**පිළිතුර තෝරමු. කියවමු. ලියමු.**

விடையை தெரிவு செய்வோம், வாசிப்போம், எழுதுவோம்.

**(කාඩ් පත/බෑග්/අත්සන්/ඉල්ලුම් පත්‍රයක්/ටෝකන්)**

1. ...................................... මෙතනින් තියලා යන්න.
2. ගිය සතියේ මම .................................. දුන්නා.
3. ....................................... එක අරගෙන යන්න.
4. මගේ සමාජික ............................ ගන්නයි ආවේ.
5. මෙතන ....................... කරන්න.

## ක්‍රියාකාරකම 03

**පිළිතුර තෝරා කියමු. ලියමු.**
**விடையைத் தெரிவு செய்து கூறுவோம், எழுதுவோம்.**

**(පොත්, අල්මාරි, දවස්, කාඩ් පත්, පිටු)**

දවස .................................
පොත .................................
කාඩ් පත .................................
පිටුව .................................
අල්මාරිය .................................

## ක්‍රියාකාරකම 04

**පිළිතුරු කියමු. ලියමු**

விடை கூறுவோம், எழுதுவோம்.

1. සාමාජික කාඩ්පත ඉල්ලුවේ කවුද? .................................
2. සාමාජික කාඩ් පත් කීයක් ලැබුණා ද? .............................
3. පොත් දවස් කීයක් තබා ගැනීමට පුළුවන් ද? .......................
4. ප්‍රමාද ගාස්තුව දිනකට කීය ද? .........................................
5. පුස්තකාලය ඇතුළට ගෙන යන්න එපා කීවේ
   මොනවා ද? ..........................................................................

## ක්‍රියාකාරකම 05

වාක්‍ය හදමු. කියවමු. ලියමු.
வாக்கியம் அமைப்போம், வாசிப்போம்,

| | | |
|---|---|---|
| පොත් | නවන්න<br>කුරුටු ගාන්න<br>පරිස්සම්<br>පිටු ඉරන්න<br>පාඩම්<br>කිලිටි කරන්න | එපා<br>කරන්න |

## ක්‍රියාකාරකම 06

පුස්තකාලයක දී දකින තවත් උපදෙස් ගළපා කියවමු. ලියමු.
நூலகத்தில் காணக்கூடிய அறிவுரைகளை வாசிப்போம், எழுதுவோம்.

| | | |
|---|---|---|
| කරුණාකර | නිශ්ශබ්ද<br>දුරකථන භාවිතයෙන්<br>කතා කිරීමෙන්<br>මෙහි ආහාර ගැනීමෙන්<br>පොත් නියමිත තැන | වන්න<br>වළකින්න<br>තබන්න |